# පැළැණ සිරි වජිරඤාණ දහම් පාසල - වැලිගම
# Pelena Siri Vajirañāna Dhamma School - Weligama

## ශ්‍රී බු. ව. 2566 - මධ්‍යවාර පරීක්ෂණය - 2022 දෙසැම්බර්
## 2566 B.E. - Mid Term Test - 2022 December
## 08 ශ්‍රේණිය - Grade - 08

**විභාග අංකය:-** ………………………………………………… **කාලය : පැය 02 යි.**

**I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

## I කොටස

01. බුදුන් වහන්සේ ගුරු තනතුරට උන්වහන්සේ විසින් පත් කර ගනු ලැබුවේ,

i. විනය ii. ධර්මය
iii. ආලාරකාලාම තවුසා iv. සර්වමිත්‍ර බමුණා

02. පුබ්බාචරිය යන නමින් හඳුන්වා ඇත්තේ කවරහු ද?

i. ළදරු පාසලේ ගුරුතුමිය ii. මව්පිය දෙපළ
iii. දහම් පාසල් ගුරුවරු iv. බුදුරජාණන් වහන්සේ

03. මවුපියන් හා දූ දරුවන් විසින් ඉටු කළ යුතු අන්‍යෝන්‍ය යුතුකම් පිළිබඳ සඳහන් සූත්‍රය කුමක්ද?

i. ව්‍යග්ගපජ්ජ සූත්‍රය ii. කාලාම සූත්‍රය
iii. සිඟාලෝවාද සූත්‍රය iv. රතන සූත්‍රය

04. ගිහිකල අහිංසක යනුවෙන් හැඳින් වූ තෙරුන් වහන්සේ කවුද?

i. අංගුලිමාල තෙරුන් ii. මහා කාශ්‍යප තෙරුන්
iii. මුගලන් තෙරුන් iv. සැරියුත් තෙරුන්

05. විශාලා මහ මහනුවර ඇතිවූ තුන් බිය නැති කිරීමට දේශනා කළ තෙරුවන් ගුණ ඇතුලත් සූත්‍රය කුමක්ද?

i. මෙත්ත සූත්‍රය ii. රතන සූත්‍රය
iii. මංගල සූත්‍රය iv. සතිපට්ඨාන සූත්‍රය

06. පොලොන්නරුව රාජධානිය පිහිට වූයේ කිනම් රජතුමා විසින්ද?

i. මහා පරාක්‍රමබාහු රජු ii. 4 වන මිහිඳු රජු
iii. වික්‍රමබාහු රජු iv. මහා විජයබාහු රජු

07. භාරතයේ සිට විදේශ රටවලට ධර්මදූත පිරිස් පිටත් කර යැවීම සිදු වූයේ

i. බුද්ධ කාලයේ දීය. ii. පළමු ධර්ම සංගායනාවෙන් පසුව ය.
iii. තෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය. iv. දෙවන ධර්ම සංගායනාවෙන් පසුව ය.

08. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අතුරින් එකක් නොවන්නේ මින් කුමක්ද?

i. ධන හානිය. ii. විලිබිය නැති වීම.

iii. අපකීර්තියට පත්වීම. iv. ලෙඩ රෝග අඩු වීම.

09. පූජා බුද්ධියෙන් කරන පරිදි පරිත්‍යාග සිදු කළ යුත්තේ කාහටද?

i. දෙමව්පියන්ට ii. වැඩිහිටියන්ට

iii. මහා සංඝ සංඝරත්නයට iv. දුගී මගී යාචකයන්ට

10. සුනීත, සෝපාක, පටාචාරා, කිසාගෝතමී යන අයට පිහිටවීමෙන් පිළිබිඹු වන්නේ බුදුන් වහන්සේගේ කිනම් ගුණය ද?

i.තාදී ගුණය ii. අසරනණ සරණ ගුණය

iii. පුරිසදම්මසාරථී ගුණය iv. සත්ථා ගුණය

11. භික්ෂූන් වහන්සේලාගේ විනය කර්ම සඳහා ඉදිකොට ඇති විෂ විශේෂ ස්ථානය හඳුන්වන නම කුමක්ද?

i. සීමා මාලකය ii. සංඝාවාසය

iii. ධර්මශාලාව iv. සක්මන් මළුව

12. බුදුන් වහන්සේ විසින් දේශනා කළ බෞද්ධයන් හට කිරීමට නුසුදුසු වෙළදාමක් නොවන්නේ මින් කුමක්ද?

i. සතුන් වෙළඳාම ii. මස් වෙළඳාම

iii. අවිආයුධ වෙලදාම iv. එලවළු වෙලදාම

13. පොළොන්නරුව වකවානුවේ පැවැති ප්‍රසිද්ධ විහාර ආරාමයක් නොවන්නේ,

i. පොලොන්නරුව ගල්විහාරය ii. සෝමාවතී සෑ රදුන්

iii. රුවන්වැලි මහ සෑ රදුන් iv. මැදිරිගිරිය වටදාගෙය

14. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි පාපමිත්‍ර සේවනයේ ආදීනවයක් නොවන්නේ මින් කුමක්ද

i. ධනවතෙක් වීම ii. සුදු කරුවෙකු වීම

iii. සල්ලාලයෙකු වීම iv. සුරාවට ලොල් වීම

15. ස්පර්ශය තුළින් ඇතිවන සැප දුක හෝ මධ්‍යස්ථ බව හඳුන්වන්නේ,

i. ඵස්ස යනුවෙනි. ii. වේදනා යනුවෙනි.

iii. සංඛාරා යනුවෙනි. iv.තණ්හා යනුවෙනි.

## II කොටස

01.

i. විහාරයක ඇති ප්‍රධානතම පූජනීය විහාරාංග ලෙස සැලකෙන්නේ මොනවාද?

ii. මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ඔබට ගතහැකි ක්‍රිය හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

iii. ශිෂ්‍යයකු වශයෙන් අන් අය වෙනුවෙන් ඔබට කළ හැකි උපකාර හතරක් සඳහන් කරන්න.

**(ලකුණු 15)**

02.

i වැඩිපුර නිදා ගැනීමෙන් හා අනවශ්‍ය ලෙස නිදි වැරීම නිසා අත්වන අනිටු විපාක දෙක බැගින් වෙන වෙනම ලියන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ අවසන් අවවාදයය කුමක්ද?

iii. සිංහල තේරුම් ලියන්නන

- සුපටිපන්නෝ
- භගවතෝ
- සාවක සංඝෝ
- උජුපටිපන්නෝ
- ඤායපටිපන්නෝ

**(ලකුණු 15)**

03. පාලියට නගන්න.

i. ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං පංචසීලං ධම්මංයාචාමී අනුග්ගහකත්වා සීලංදේථ මේ භන්තේ

ii. භගවතා ධම්මෝ ස්වාක්ඛාතෝ සංදිඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.

**(ලකුණු 15)**

04.

i. අභිධර්මයට අනුව රූපයක ස්වභාවය හඳුන්වා දෙන්න.

ii. ලක්ෂණ රූප 04 නම් කර කෙටියෙන් හඳුන්වන්න.

**(ලකුණු 15)**